පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

දෙවන වාරය - මැයි මස පළමු සතිය

ශ්‍රේණිය - 9

සැකසුම - එච්.ඒ සංජය උදය කුමාර

සති පාසල කාර්ය පත්‍රිකාව

පාඩම හෝ ඒකකය - ශෛලිගත නාට්‍ය රසවිඳීමු

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් වශයෙන් තෝරාගත් ශිල්පීන්ගේ කලානිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.4 : තෝරාගත් ශෛලිගත චේදිකා නාට්‍යයක දක්නට ලැබෙන චිත්‍රමය ගුණාංග රසාස්වාදය කරයි.

පෙර ඉගෙනුම් අවස්ථා/ ශිෂ්‍යා කළයුතු කාර්යන්

01. ශෛලිගත නාට්‍ය කිහිපයක කොටස් බලන්න. එවායේ පසුතලය එනම් නාට්‍ය බලන කෙනාට අවස්ථාවට උචිත පසුබිම මවා දැක්වීමට නිර්මාණය කර ඇති දේවල්, එම නාට්‍යවල රඟදක්වන නළුවන් එම චරිතයට අදාළ භූමිකාවට උචිත ලක්ෂණ මතුකිරීම සඳහා මුහුණු වර්ණ කිරීම, ඇඳ පැළඳ සිටින අයුරු හොඳින් බලන්න. රංග භාණ්ඩ මොනවද කියලා බලන්න. පහත යූ ටියුබ් සබැඳි උදව් කර ගන්න.

මනමේ නාට්‍ය - **https://youtu.be/wJ2Mi09hGuI**
සිංහබාහු නාට්‍ය - **https://youtu.be/InhrCitmixs**
හුණුවටයේ කතාව - **https://youtu.be/TNfTvObhaMs**
බෙරහඬ නාට්‍ය - **https://youtu.be/RBIUZOLnyO0**
නරිබෑනා නාට්‍ය - **https://youtu.be/nX6hs9mtqEw**

02. පහත සඳහන් පොත්පත් හෝ නාට්‍ය ගැන ලියවී ඇති පොත්පත් සොයා කියවන්න.
චිත්‍ර කලාව-තිලකරත්න දිගන්වල මහතා-ශෛලිගත නාට්‍ය රස විඳීමු (පිටුව 91).
නාට්‍ය හා රංග කලාව-10,11 ශ්‍රේණි-ඥානසිරි පීරිස් මහතා (පිටුව 286).
නාට්‍ය හා රංග කලාව-නිර්මලා චාන්දනී ගමගේ මිය (පිටුව 11).

03. විකිපීඩියා ලිපි සොයා කියවන්න -
"https://si.wikipedia.org/w/index.php?title=වේදිකා_නාට්‍ය_නිර්මාණයේ_ආනුෂාංගික_අංග&oldid=470831"

04. මේ පිළිබඳව ලියවුනු පුවත්පත් ලිපි/ වෙබ් පිටු සොයා කියවන්න
පුවත්පත් ලිපි - **http://archives.sarasaviya.lk/2018/01/25/?fn=sa1801254**

කියවීම් පතිකාව

ශෛලිගත නාට්‍යය හැඳින්වීම

නාට්‍ය ධර්මී සහ ලෝක ධර්මී යනුවෙන් ප්‍රධාන නාට්‍ය වර්ග දෙකක් වේ. මේ අතරින් ශෛලිගත නාට්‍යය අයත් වන්නේ නාට්‍ය ධර්මී අතරට ය. එම ශෛලිගත නාට්‍යයක විශේෂ ලක්ෂණ වන්නේ නාට්‍යයට අදාළ සියලු දෙබස්, ගීත සහ රිද්මානුකූල දෙබස් අනුසාරයෙන් යුක්ත වීම සහ නාට්‍යයේ සියලු ම අංග චලනයන් සහ ඇවිදයාම ආදිය සංගීත නාදයට සහ ගීතවලට අනුකූල ව රිද්මානුකූල ව සිදුවීම යි. මනමේ, සිංහබාහු සහ බෙරහඬ වැනි නාට්‍ය නිදසුන් ලෙස හැඳින්විය හැකි ය.

මනමේ චේදිකා නාට්‍යයේ අවස්ථාවක්

සිංහබාහු චේදිකා නාට්‍යයේ අවස්ථාවක්

බෙරහඬ චේදිකා නාට්‍යයේ අවස්ථාවක්

පසුතල නිර්මාණය

ශෛලිගත නාට්‍යවල දී චේදිකා පසුතලය චාම් සහ සරල බවකින් යුක්ත වේ. විශේෂයෙන් ම මෙහි දී ඒ ඒ අවස්ථාවට උචිත පසුබිම, ගීත ආදියෙන් ප්‍රේක්ෂකයාගේ මනසෙහි මවා දැක්වීමක් සිදු කරයි.

අමතර කියවීමට - නාට්‍ය හා රංග කලාව 11ශ්‍රේණිය -ඥානසිරි පීරිස් මහතා - රංගභූමි අලංකාරය (පිටුව 59)

අංග රචනය

ශෛලිගත නාට්‍යක අංග රචනය (වේෂ නිරූපණය) බහුල ව ම යොදා ගැනේ. ඒ ඒ චරිතයට අදාළ භූමිකාව සහ ගති ලක්ෂණ ඉස්මතු කර ගැනීම සඳහා අවශ්‍ය ආකාරයට මුහුණ පාට කිරීම සහ වෙනත් සලකුණු ඇඳීම මෙන් ම රැවුළු, කොණ්ඩා ආදිය ඇලවීම ආදිය මෙම නාට්‍යවල බහුල ව ම සිදු වේ. සිංහබාහු නාට්‍යයේ සිංහයාගේ චරිතය සහ මනමේ නාට්‍යයේ වැදි රජුගේ චරිතය නිදසුන් ලෙස දැක්විය හැකි ය.

රංග භාණ්ඩ

ශෛලිගත නාට්‍යවල එන විවිධ චරිතවලට අදාළ භූමිකාව ඉස්මතු කරලීම සඳහා රංග භාණ්ඩ අත්‍යවශ්‍ය වේ. එමෙන් ම එයින් නාට්‍යට යම්කිසි අලංකාරයක් ද ගෙන දේ. කඩු, හෙල්ල, තෝමර වැනි දේවල් මෙයට අයත් වේ.

රංග වස්ත්‍රාභරණ

නාට්‍යට අදාළ චරිතවල භූමිකාව සාර්ථක ව ප්‍රකාශ වීම සඳහාත් නාට්‍යයේ අලංකාරය උදෙසාත් රංග වස්ත්‍රාභරණවලින් මහත් පිටුවහලක් ලැබේ. ඇඳුම්, ඔටුනු, නළල්පට, කර මාල, උර මාල, වළලු, තෝඩු, මුදු, පාද ජාලා, පාද සලං සහ සපත්තු රංග වස්ත්‍රාභරණ ලෙස නම් කළ හැකි ය.

ඉගෙනුම් පල :
- ශෛලිගත චේදිකා නාට්‍යයක විශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ශෛලිගත චේදිකා නාට්‍ය කිහිපයක් නම් කරයි.
- ශෛලිගත චේදිකා නාට්‍යවල දී අංග රචනය භාවිත කරනු ලබන ආකාරය තෝරාගත් චේදිකා නාට්‍යක් ඇසුරින් පැහැදිලි කරයි.
- ශෛලිගත චේදිකා නාට්‍යවල චරිතවලට උචිත ආකාරයට රංග භාණ්ඩ සහ රංග වස්ත්‍රාභරණ යොදා ගනු ලබන ආකාරය විස්තර කරයි.

පසු ඉගෙනුම් අවස්ථා

01. පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.
02. අමාරු යෙදුම් හා තේරුම් ගැනීමට අපහසු වචන වැඩිහිටියෙකුගෙන්, ගුරුවරයෙකුගෙන් විමසා හෝ ශබ්ද කෝෂයකින් බලා අවබෝධ කර ගන්න. සෑම වචනයක්ම සැක නැතිව පැහැදිළි කර ගන්න.
03. ශබ්ද නගා කියවන්න, අමතක වන විට නැවත නැවත කියවන්න. මතකයෙන් පාඩම තවත් අයෙකුට පවසන්න, ඔබ කතාවක් කියන විලසින් හෝ කෙනෙකුට කතාන්දරයක් කියන විලසින් කියාදෙන්න.
04. ශෛලිගත නාට්‍යවල භාවිතා වන කලා අංගයන්ගේ කලා ලක්ෂණ, සුවිශේෂී කලා ලක්ෂණ හඳුනාගන්න. ස්වතන්ත්‍ර නිර්මාණ (ඔබ විසින් කරණ නිර්මාණ) සඳහා යොදා ගන්න උත්සහ කරන්න.
05. ඔබ කැමති නාට්‍යකට පසුතලයක් චිත්‍රණය කරන්න.
06. ඔබ කැමති සිත්ගත් නාට්‍ය චරිතයකට සුදුසු ඇඳුමක් හා මුහුණේ ස්වභාවය නිරූපනය වන චිත්‍රයක් අඳින්න.
07. පහත දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න, තවත් ආදර්ශ ප්‍රශ්න පත්‍ර සොයාගෙන පිලිතුරු ලියන්න, පසුගිය අ.පො.ස.(සා/පෙ) ප්‍රශ්න පත්‍රවල ශෛලිගත නාට්‍ය වදින් අසාඇති අදාළ ප්‍රශ්න සඳහා පිලිතුරු ලියන්න. ගැටළු ඇති තැන් ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.

පොදු ඉගෙනුම් අවස්ථා - පන්ති කාමරයේදී

01. යහළුවන් සමග විෂය කරුණු හා ගැටළු පිළිබඳ සාකච්ඡා කරන්න.
02. අන් අය සතු පාඩමට අදාළ අමතර දැනුම අසා දැන ගන්න.
03. තමා විසින් කළ නිර්මාණය සහෝදර සිසුන් සමග හුවමාරු කර ගන්න.
04 සාමූහිකව නාට්‍ය ආශ්‍රිත රංගනයන් ඉදිරිපත් කරන්න.

භාහිර ඉගෙනුම් අවස්ථා/සහායක ඉගෙනුම් ආධාරක/ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි දේ.

01. **යූ ටියුබ් නාලිකා** - නාට්‍ය ධර්මී නාට්‍ය - https://youtu.be/hmbVMQP6WRA

02.**පොත්පත්** - චිත්‍ර කලාව-තිලකරත්න දිගන්වල මහතා-ශෛලිගත නාට්‍ය රස විඳීමු (පිටුව 91).
නාට්‍ය හා රංග කලාව-10,11 ශ්‍රේණි-ඥානසිරි පීරිස් මහතා .
නාට්‍ය හා රංග කලාව-නිර්මලා චාන්දනී ගමගේ මිය
හුණුවටයේ කතාව-බර්ටෝල් බ්‍රෙෂ්ට් පරිවර්තනය හෙන්රි ජයසේන මහතා
මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රනාට්‍යාවලිය-සුනිල් මිහිඳුකුල මහතා.

03. **ඊ පාසල් පාඩම් - ඊ තක්සලාව** *https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=195&lang=si*

ඊ නැණ පියස - https://www.enenapiyasa.lk/lms/mod/folder/view.php?id=7560

https://www.enenapiyasa.lk/lms/course/view.php?id=137

පිලිතුරු සපයන්න ගුරුතුමාට ඉදිරිපත් කරන්න.

ශෛලිගත චේදිකා නාට්‍යයක විශේෂ ලක්ෂණ විස්තර කර එවැනි නාට්‍ය කිහිපයක් නම් කරන්න.
ශෛලිගත චේදිකා නාට්‍යවල දී අංග රචනය භාවිත කරනු ලබන ආකාරය තෝරා ගත් චේදිකා නාට්‍යක් ඇසුරින් පැහැදිලි කරන්න.
ශෛලීගත චේදිකා නාට්‍යවල චරිතවලට උචිත ආකාරයට රංග භාණ්ඩ සහ රංග වස්ත්‍රාභරණ යොදාගනු ලබන ආකාරය විස්තර කරන්න.